පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2024/08

මගේ අංකය - එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/0

පළාත් භාණ්ඩාගාරය,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

උතුරු මැද පළාත.

2024.07.25

සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානින්,

ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් හා

ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ ප්‍රසම්පාදන කටයුතු වලට අදාල මූල්‍ය රීති සංශෝධනය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19.5 හා 20.3 වගන්ති යටතේ ගරු අණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2008.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවා ඇති උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයේ සැපයුම්, වැඩ, සේවා හා බැහැර කිරීම් පරිච්ඡේදයේ සඳහන් පහත රීතින් සංශෝධනය කිරීම සඳහා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

I. පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 422.1 යටතේ දක්වා ඇති විවෘත තරඟකාරී හෝ ඍජු කොන්ත්‍රාත් සම්බන්ධ ප්‍රසම්පාදන අධිකාරී සීමා හා ඒ යටතේ පසු කාලීනව සිදු කරන ලද සියලු සංශෝධනයන් අවලංගු කර, ඒ වෙනුවට මෙම චක්‍රලේඛයේ වගු අංක 01 මගින් දක්වා ඇති සීමාවන් බලාත්මක කිරීම.

II. පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 422.2 යටතේ දක්වා ඇති වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය සම්බන්ධ ප්‍රසම්පාදන අධිකාරී සීමා හා ඒ යටතේ පසුකාලීනව සිදු කරන ලද සියලු සංශෝධනයන් අවලංගු කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛයට යා කර ඇති වගු අංක 02 මගින් දක්වා ඇති සීමාවන් බලාත්මක කිරීම.

III. පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 422.3 යටතේ දක්වා ඇති ඍජු මිලදී ගැනීම, සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා සම්බන්ධ ප්‍රසම්පාදන අධිකාරී සීමා හා ඒ යටතේ පසු කාලීනව සිදු කරන ලද සියලු සංශෝධනයන් අවලංගු කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛයට යා කර ඇති වගු අංක 03 මගින් දක්වා ඇති සීමාවන් බලාත්මක කිරීම.

IV. පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 426 යටතේ දක්වා ඇති කොන්ත්‍රාත්තු අත්සන් කිරීමට සම්බන්ධ අධිකාරී සීමා හා ඒ යටතේ පසුකාලීනව සිදු කරන ලද සියලු සංශෝධන අවලංගු කර ඒ වෙනුවට මුළු පිරිවැය ඇස්තමේන්තු අනුමත කිරීම් හා ගිවිසුම් අත්සන් කිරීමට අදාලව මෙම චක්‍රලේඛයට යා කර ඇති වගු අංක 04 සහ 05 මගින් දක්වා ඇති සීමාවන් බලාත්මක කිරීම.

V. මෙම චක්‍රලේඛයට යා කර ඇති වගු අංක 06 හා 07 හි දැක්වෙන පරිදි පිළිවලින් ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරී සීමාවන් හා පළාත් මූල්‍ය රීති 83 යටතේ අනුමත කිරීම් අධිකාරී සීමාවන් පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 426.1 යටතේ අළුතින් ඇතුළත් කිරීම.

02. 2024/06/25 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක 40 මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් මාර්ගෝපදේශ 9.3 මෝටර් වාහන සහ උපකරණ අලුත්වැඩියා කිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු සීමාව වන රු.100,000/- ක සීමාව රු.700,000/- දක්වා සංශෝධනය කර ඇති බැවින් ඒ මත පදනම්ව ඊට යටත්ව පළාත් සභාවේ එකී මෝටර් වාහන සහ උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු සීමාව රු.500,000/- දක්වා සංශෝධනය කරනු ලැබේ.

03. උක්ත හිසින් යුතුව 2015.01.26 දිනැතිව නිකුත් කර ඇති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2015/06 හා එම චක්‍රලේඛය සංශෝධනය කරමින් නිකුත් කර ඇති 2015.03.25 දිනැති අංක 2015/06 (i), 2015.08.04 දිනැති අංක 2015/06(ii), 2021/06/29 දිනැති අංක 2015/06 (iii), 2022.08.02 දිනැති අංක 2015/06 (iv) සහ 2023.08.01 දිනැති අංක 2015/06 (v) දරණ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ ද අවලංගු කරනු ලැබේ. පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 423.5 යටතේ ප්‍රසම්පාදන මණ්ඩල සමාජිකයින්ට හා තාක්ෂණ ඇගයුම් කමිටු සමාජිකයින්ට ගෙවීම් සංශෝධනය කිරීම යන මැයෙන් 2020.12.10 දිනැතිව නිකුත් කර ඇති අංක 2020/13 දරණ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය තවදුරටත් වලංගු වේ.

04. මෙම සංශෝධනයන් 2024.07.01 දින සිට බලපැවැත් වේ.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

පිටපත්.

01. විගණකාධිපති - දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - දැ.පි.

වගු අංක 01

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.14.1 |
|---|
| **කොන්ත්‍රාත් පිරිනැමීම නිර්දේශ/නිර්ණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාවන්** |
| **භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය (මාර්ගෝපදේශ 3.1, 3.2 හෝ 3.3), සෘජු කොන්ත්‍රාත් පටිපාටිය (මාර්ගෝපදේශ 3.5) හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ 3.6) අනුගමනය කිරීමේදී;** |
| 1. ප්‍රසම්පාදන අධිකාරිය තීරණය කිරීමේදී එක් එක් ප්‍රසම්පාදනය සඳහා වන මුළු පිරිවැය ඇස්තමේන්තුව සැළකිල්ලට ගත යුතු ය. මුළු පිරිවැය ඇස්තමේන්තු තීරණය කිරීමේදී සියලුම ආශ්‍රිත වියදම් එනම් ප්‍රසම්පාදනයට සූදානම් වීමේ කටයුතු වල වියදම් සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව සිදු වන වියදම් මුළු පිරිවැය ඇස්තමේන්තුවේ වෙන් වශයෙන් සඳහන් කල යුතුය.<br><br>2. කුලියට දීම සහ බදු දීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අධිකාරිය තීරණය කිරීමේදී සම්පූර්ණ කුලිය හෝ බදු කාල සීමාව සඳහා කොන්ත්‍රාත්තුවේ වටිනාකම සැලකිල්ලට ගත යුතුය. |

| අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු |
|---|---|---|
| පළාත් අමාත්‍ය මණ්ඩල විසින් පත් කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව/ පළාත් අමාත්‍ය මණ්ඩල විසින් පත් කල ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 45 ට වැඩි | රු.මි. 150 ට වැඩි |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 45 දක්වා | රු.මි. 150 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව * (පළමු වර්ගීකරණය) | රු.මි.30 දක්වා | රු.මි. 60 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව * * (දෙවන වර්ගීකරණය ) | රු.මි. 15 දක්වා | රු.මි. 30 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 7.5 දක්වා | රු.මි. 15 දක්වා |

පළමු වර්ගීකරණය *
මෙම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාවන් අදාල කර ගත යුත්තේ ඒ පන්තියේ දෙපාර්තමේන්තු සඳහා පමණි. (2013/01/01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩල වාර්තාව අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා දීප ව්‍යාප්ත සේවාවක පළමුවන පන්තියේ නිලධාරියෙකු වන හෝ SL 1 - 2016 වැටුප් කාණ්ඩයේ රු. 47,615.00 ක හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන විධායක සේවයක පළමු වන පන්තියේ නිලධාරියෙකු වන දෙපාර්තමේන්තු A ශ්‍රේණියේ දෙපාර්තමේන්තු වේ.)

දෙවන වර්ගීකරණය **
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාවන් අදාල කර ගත යුත්තේ බී හා සී පන්තියේ දෙපාර්තමේන්තු සඳහා පමණි. (2013/01/01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා පොර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩල වාර්තා අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා දීප ව්‍යාප්ත සේවාවක දෙවන හෝ තුන්වන පන්තියේ නිලධාරියෙකු වන හෝ විධායක සේවාවක දෙවන හෝ තුන්වන පන්තියේ නිලධාරියෙකු වන දෙපාර්තමේන්තු පිළිවෙලින් බී හා සී ශ්‍රේණියේ දෙපාර්තමේන්තු වේ.)

වගු අංක 02

| |
|---|
| **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.14.1 (සබැදි)** |
| **භාණ්ඩ, වැඩ සහ සේවා (උපදේශක සේවා නොවන) ප්‍රසම්පාදනය සඳහා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී (මාර්ගෝපදේශ 3.4)** |
| 1. සැපයුම් සහ සේවා කොන්ත්‍රාත්තු සඳහා පහත සඳහන් අය වෙතින් මිල ගණන් කැඳවිය හැකිය<br>(අ) ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් වෙතින් (ප්‍රකට) වෙළඳුන්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම්<br>(ආ) පළාත් සභාවේ හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි ලියාපදිංචි සැපයුම්කරුවන් (අදාල වේ නම්)<br>(ඇ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ විසින් පවත්වාගෙන යනු ලබන ඉලෙක්ට්‍රොනික රජයේ ප්‍රසම්පාදන වේදිකාව (Electronic Government Procurement Platform) යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන් (www.promise.lk)<br>2. ඉදි කිරීම් කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජාපාදක සංවිධාන ද ඇතුලු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවිය හැකිය.<br>අදාල අවස්ථාවන්හි දී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛන භාවිතා කල යුතුය. එසේම කලින් දැනුම් දුන් දිනක ලංසු භාර ගැනීම අවසන් කල යුතු අතර එම ලංසු ප්‍රසිද්ධියේ විවෘත කල යුතුය. |

| අධිකාරිය | කැඳවිය යුතු අවම මිල ගණන් ප්‍රමාණය | අධිකාරී සීමාව (රු.මි.) | |
|---|---|---|---|
| | | ශ්‍රී ලංකා රජයේ අරමුදල් | විදේශ අරමුදල් |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | වැඩ<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 10 දක්වා | 12 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා-<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 07 දක්වා | 07 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -<br>මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 1.5 දක්වා | 1.5 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව *පළමු වර්ගීකරණය | වැඩ<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 06 දක්වා | 08 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා-<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 03 දක්වා | 04 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -<br>මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 0.75 දක්වා | 0.75 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව ** දෙවන වර්ගීකරණය | වැඩ<br>මුද්‍රා තැබූ මිල ගණන් 05ට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මි. 03 දක්වා | රු.මි. 05 දක්වා |
| | භාණ්ඩ හා උපදේශකාත්මක සේවා නොවන සේවා<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 ට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මි. 1.5 දක්වා | රු.මි. 1.5 දක්වා |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩ හා උපදේශකාත්මක සේවා නොවන සේවා<br>මුද්‍රා තැබූ මිල ගණන් 03 ට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මි. 0.3 දක්වා | රු.මි. 0.3 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | වැඩ<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මි. 02 දක්වා | රු.මි. 02 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නෙවන සේවා-<br>මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මි. 01 දක්වා | රු.මි. 01 දක්වා |
| අමාත්‍යාංශලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | වැඩ<br>මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මි. 0.5 දක්වා | |
| | භාණ්ඩ හා උපදේශක සේවා නෙවන සේවා-<br>මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම | රු.මි. 0.2 දක්වා | |

වගු අංක 03

| | | |
|---|---|---|
| | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.14.1 (සබැදි) |
| සුළු වටිනාකම සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිල දී ගැනීම් (මාර්ගෝපදේශ 3.5 හෝ 3.6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන) | | |
| අධිකාරිය | සම්පූර්ණ කල යුතු කරුණු | අධිකාරී සීමාව (රු.) |
| ප්‍ර.ග.නි./දෙ.ප්‍ර/ව්‍යා.අ. | වැඩ<br>• මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සදහන් අවශ්‍යතා සපුරාලන | රු. 150,000 දක්වා |
| | වැඩ<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිවැසුම්දායි නොවන විට,<br>• ප්‍රසම්පාදනයේ පිරිවැසුම්දායි බව පිළිබදව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර /ව්‍යා.අ. සහතික විය යුතුය<br>• අධිකාරය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර/ව්‍යා.අ.ගේ පෞද්ගලික අධික්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතු අතර වෙනත් පුද්ගලයකු වෙත නොපැවරිය යුතුය. | රු. 75,000.00 දක්වා |
| | භාණ්ඩ හා උපදේශ සේවා නොවන සේවා ,<br>• මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 සදහන් අවශ්‍යතා සපුරාලන<br>සෘජුවම වෙළඳපොළෙන් භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය,<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායි නොවන විට,<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායි බව පිළිබදව ප්‍ර.ග.නි/දෙ/ප්‍ර/ව්‍යා.අ/සහතික විය යුතුය<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර /ව්‍යා.අ.ගේ පෞද්ගලික අධික්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය | රු. 75,000.00 දක්වා<br><br>රු. 50,000.00 දක්වා |
| ප්‍ර.ග.නි./දෙ.ප්‍ර/ව්‍යා.අ. | මෝටර් රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියාව,<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිවැසුම්දායි නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිවැසුම්දායි බව පිළිබදව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර/ව්‍යා.අ.සහතික විය යුතුය<br>• මෙම අධිකාරය දෙ.ප්‍ර/ව්‍යා.අ. සහතික විය යුතුය<br>• රු. 500,000/- ඉක්මවන අළුත්වැඩියාවන් සඳහා ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතුය. | රු. 500,000.00 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අධිකාරී බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාල ඒකක/අංශ භාරව කටයුතු කරන නිලධාරීන් | එක් වතාවක දී එක් කටයුත්තක් සඳහා රු.10,000/- නොඉක්මවන පරිදි සුළු වටිනාකම්වලින් යුතු උපකරණ ඇතුළු භාණ්ඩ හා සේවා මිල දී ගැනීම<br>• එක් ලිත් මාසයක් තුළ සිදු කරන එවැනි මිල දී ගැනීම් වල එකතුව රු. 40,000/- නොඉක්මවිය යුතුය. | රු.10,000.00 දක්වා |
| දෙ.ප්‍ර.විසින් අධිකාරී බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාල ඒකක/අංශ භාරව කටයුතු කරන නිළධාරීන් | මසකට රු. 30,000/- නොඉක්මවන මෝටර් වාහන අළුත්වැඩියා කිරිම | රු. 30,000.00 |

- ප්‍ර.ග.නි. - ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
- දෙ.ප්‍ර. - දෙපාර්තමේන්තු ප්‍රධානි
- ව්‍යා.අ. - ව්‍යාපෘති අධ්‍යක්ෂ

වගු අංක 04

පළාත් මූල්‍ය රීති අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු අනුමත කිරීම හා ගිවිසුම් අත්සන් කිරීමට අදාල අධිකාරී සීමාවන්

❖ **මුළු පිරිවැය ඇස්තමේන්තු අනුමත කිරීම (පළාත් මූල්‍ය රීති 20 හා 34 ට අනුකූලව)**

| මුළු පිරිවැය ඇස්තමේන්තු අනුමත කිරීමේ සීමාව | නිසි අධිකාරිය |
|---|---|
| මිලියන 50 ට වැඩි | පළාත් සැළසුම් කමිටුව |
| මිලියන 15 දක්වා | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා |
| මිලියන 10 දක්වා | ගණන්දීමේ නිලධාරියා |

❖ මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී, ප්‍රසම්පාදනයට අදාල සියලුම වියදම් සැලකිල්ලට ගත යුතු අතර ප්‍රසම්පාදනයට සූදානම් වීමේ කටයුතු සඳහා 5% උපරිමයක් ද භෞතික හදිසි අවිනිශ්චිත අවශ්‍යතා සඳහා 10% උපරිමයක් ද මිල පිළිබඳ හදිසි අවිනිශ්චිත හානියක් සඳහා සාධාරණ ලෙස ඇස්තමේන්තු මුදලක් ඇතුළත් විය යුතු වෙයි. මුළු පිරිවැය ඇස්තමේන්තුවේ අදාල වැට් බදු වෙන් වශයෙන් ඇතුළත් කළ යුතුය.

වගු අංක 05

**ගිවිසුම් අත්සන් කිරීම**

ප්‍රසම්පාදන කමිටුව විසින් කර ඇති නිර්දේශ/ තීරණයන් සඳහා නියම කර ඇති අනුමත කිරීමේ අධිකාරීන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ගිවිසුම් අත්සන් කිරීම ප්‍රසම්පාදනයක් ලබා ගන්නා ප්‍රසම්පාදන අස්ථිත්වය අයත් ගණන් දීමේ නිලධාරියා විසින් හෝ බලය පැවරීම සම්බන්ධයෙන් ප.මූ.රී.83 හි සඳහන් විධිවිධාන යටතේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා/ ගණන්දීමේ නිලධාරියා විසින් බලය පවරනු ලැබූ නිලධාරියකු විසින් හෝ කළ යුතු වේ. එම සීමාවන් පහත සීමාවන්ට යටත්ව තීරණය කළ යුතු වේ.

| කොන්ත්‍රාත් වටිනාකම | | නිසි අධිකාරිය |
|---|---|---|
| දේශීය අරමුදල් | විදේශීය අරමුදල් | |
| රු.මි. 45 ට වැඩි | රු.මි 150ට වැඩි | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී |
| රු.මි. 45 දක්වා | රු.මි. 150 දක්වා | ගණන්දීමේ නිලධාරී |
| රු.මි. 15 දක්වා | රු.මි. 30 දක්වා | ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානීන් |

ගිවිසුම් අවම වශයෙන් පිටපත් හතරකින් (04) යුක්තව අත්සන් කළ යුතු අතර ඉන් එක් පිටපතක් කොන්ත්‍රාත්කරුට ද, එක් පිටපතක් ඉංජිනේරු වෙත ද (අදාල වන පරිදි) එක් පිටපතක් විගණකාධිපති වෙත ද යවා අනිත් පිටපත ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අදාල ගොනුවේ තබාගත යුතුය. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවකදී කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා නිර්දේශිත කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ ලංසුව හා ඒ සමඟ ඉදිරිපත් කළ සියලුම ලේඛන වල පිටපතක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත ලබා දිය යුතුය.

## වගු අංක 06

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව 2.14.1 (සබැඳි) | |
|---|---|
| **ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරී සීමාවන්,** | |
| ශ්‍රී ලංකා රජයේ අරමුදලින් කරන ප්‍රසම්පාදනවලට අදාළව ඉතා හදිසි සහ ඉතා විශේෂ වූ කරුණු හේතුවෙන් නියමිත ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීම අවශ්‍ය වන විට පහත නියම කර ඇති සීමාවන්ට යටත්ව ඒ සඳහා බලය දීමට නිසි අධිකාරියට හැකිය. එවන් අවස්ථාවලදී ඊට හේතු පැහැදිලි ව ලිඛිතව වාර්තා කළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතුය. | |
| නිසි අධිකාරී | ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරී සීමාවන් |
| අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියා (ඔහුගේ පෞද්ගලික අනුමැතිය ලැබිය යුතුය) | රු.75,000 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 1.5 දක්වා |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 4.5 දක්වා |
| අමාත්‍ය මණ්ඩලය | රු.මි. 4.5 ට වැඩි |

## වගු අංක 07

| අනුමත කිරීමේ අධිකාරිය | |
|---|---|
| කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර, ප්‍රසම්පාදන කමිටුව විසින් කර ඇති නිර්දේශ/ නිර්ණයන් සඳහා පහත සඳහන් අධිකාරීන්ගේ (බලය පැවරීම සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 83 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව) අනුමැතිය ලබා ගත යුතුය. | |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව<br>දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව<br>අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා. |
| අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව | අමාත්‍ය මණ්ඩලය |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව/දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු/ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු අධිකාරී සීමාවන් තුළ පහළ වටිනාකම් සහිත ප්‍රසම්පාදන කටයුතු සඳහා සුළු කමිටුවක්/කමිටු පත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හැකිය. එවිට ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2.7.4, 2.7.5 හා 2.7.6 යටතේ සඳහන් කමිටු සංයුතිය වෙනස් කිරීමට ද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හැකිය. | |